**කළුතර ප්‍රාදේශීය සභාව**
**කළුතර දිස්ත්‍රික්කය**

--------------------------

1. මූල්‍ය ප්‍රකාශන

------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 14 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 නොවැම්බර් 14 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

-------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වල වැදගත් බව හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට කළුතර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයේ අඩුවෙන් ප්‍රතිපාදනය කර තිබූ රු.723,299 ක් වූ ණයහිමි ශේෂය සමාලෝචිත වර්ෂයේ රු.586,787 ක් ලෙස ගිණුම්වලට ගලපා තිබීමෙන් සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය රු.136,512 කින් අඩුවෙන් දැක්විණ.

(ආ) සභා තීරණ අනුව සමාලෝචිත වර්ෂයේදී කපා හැර තිබූ වරිපනම් බදු, වෙළඳ බලපත්‍ර, කර්මාන්ත බදු හා ව්‍යාපාර බදු පිළිවෙලින් රු.6,435, රු.26,600, රු.19,780 ක් හා රු.27,040 ක් අදාල හිඟ ආදායම් ගිණුම්වලට පමණක් ගලපා තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ මාගේ වාර්තාවේ 2.2.1 (ආ) ජේදයේ දක්වා තිබූ වැය විෂයට පමණක් හර කර තිබූ රු.160,912 ක් වූ ණයහිමි ශේෂය සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කිරීමේදී ණයහිමි ගිණුම බැර කර අවිනිශ්චිත ගිණුම හර කළ යුතු වුවත් සමුච්චිත අරමුදල් ගිණුම හර කර තිබීම නිසා එම වටිනාකමින් සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය අඩුවෙන් දැක්විණි.

(ඈ) ඉකුත් වර්ෂය අවසානයට ව්‍යාපෘති වෙනුවෙන් ලැබිය යුතු ශේෂය රු.20,807,718 ක් වුවද ඒ සඳහා රු.21,692,325 ක්ද, සමාලෝචිත වර්ෂයට අදාල ව්‍යාපෘති වෙනුවෙන් රු.7,028,289 ක්ද ලැබී තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයේ ඌන ප්‍රතිපාදනය රු.884,607 ක් වුවද ඒ වෙනුවට රු.3,654,321 ක් කර්මාන්ත ණයගැති ගිණුමට සහ සමුච්චිත අරමුදල් ගිණුමට ගැලපීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත ණයගැති ගිණමේ ශේෂය රු.28,986,704 ක් විය යුතු වුවද රු.31,756,418 ක් ලෙස ගිණුම්වල දැක්විණි.

(ඉ) ඉකුත් වර්ෂය අවසානයට කර්මාන්ත ණයහිමියන් වෙනුවෙන් ගෙවිය යුතු ශේෂය රු.23,027,435 ක් වූ අතර ඉන් රු.21,723,050 ක් ද සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘති වෙනුවෙන් රු.7,028,289 ක් ද ගෙවා තිබුණි. ඉකුත් වර්ෂවලට අදාල කර්මාන්ත ණයහිමි ශේෂයක් තවදුරටත් නොමැති බව දක්වා තිබූ බැවින ඉකුත් වර්ෂවල වැඩියෙන් ප්‍රතිපාදනය කර තිබූ රු.1,304,385 ක් ගිණුම්වලින් කපා හැරිය යුතු වුවත් ණයහිමි ගිණුමට රු.1,465,361 ක් තවදුරටත් බැර කර තිබීම නිසා වර්ෂය අවසානයට

කර්මාන්ත ණයහිමි ගිණුමේ ශේෂය සහ සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය රු.2,769,746 ක් වැඩියෙන් දැක්විණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත ණයගැති හා ණයහිමි ගිණුම්වල රු.31,756,418 ක් වූ හර හා බැර ශේෂ එකිනෙකට හිලව් කර තිබුණි.

(උ) 2009 සිට හිඟ හිටි වෙනත් ආදායම් ගිණුමට සාවද්‍ය ලෙස ගිණුම් ගත කර තිබූ රු.11,493,587 ක ශේෂ කර්මාන්ත ණයගැති ගිණුමෙන් ඉවත් කර නොතිබුණි. තවද 2010 සිට 2012 වර්ෂය දක්වා ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ එකතුව රු.3,598,755 ක් සහ 2009 සිට 2012 වර්ෂය දක්වා ලැබිය යුතු සහික දීමනා එකතුව රු.437,350 ක් වැඩියෙන් ගිණුම් ගත කර තිබීම නිසා හිඟ හිටි ආදායම් ගිණුමේ ශේෂය රු.15,529,963 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ සහ ලැබිය යුතු සහික දීමනා පිළිවෙලින් රු.1,612,204 ක් හා රු.349,500 ක් වුවත් පිළිවෙලින් රු.2,081,066 ක් හා රු560,350 ක් ප්‍රතිපාදනය කර තිබීමෙන් වර්ෂයේ ආදායම සහ හිඟ හිටි වෙනත් ආදායම් ශේෂය රු.679,712 කින් වැඩියෙන් දැක්විණි.

(එ) ඒකාබද්ධ ලැබීම් සාරාංශය (ප්‍රා.ස. 16) අනුව සමාලෝචිත වර්ෂයේ බලපත්‍ර ගාස්තු ආදායම රු.111,667 ක් වුවද ආදායම් හා වියදම් ගිණුමට රු.76,267 ක් ලෙස ගිණුම් ගත කර තිබීමෙන් වර්ෂයේ ආදායම් රු.35,400 ක් අඩුවෙන් දැක්විණි.

(ඒ) සාරාංශ ආදායම් ලේඛනය අනුව සමාලෝචිත වර්ෂයේ ලැබී තිබූ පොලී ආදායම් (1/61) රු.70,647 ක් ආදායම් හා වියදම් ගිණුමට ගිණුම් ගත කර නොතිබුණි.

(ඔ) මාසික ලැබීම් ජර්නලය අනුව 2013 දෙසැම්බර් මාසයේ ලැබී තිබූ කුලී ආදායම් (5/25) රු.27,600 ක් හා විශේෂ බදු (6/16) රු.3,750 ක් සාරාංශ ආදායම් ලේඛනයට සටහන් වී නොතිබීම නිසා ආදායම් හා වියදම් ගිණුමට ගිණුම් ගත කර නොතිබුණි.

(ඕ) ඉකුත් වර්ෂයේ අවසාන ශේෂ, සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂ ලෙස ප්‍රධාන ලෙජරයට උපුටා ගැනීමේදී සහ සේවක ඇප පොලිය, වරිපනම් කලින් ලැබීම් ගිණුම් ගත කිරීම සහ වත්කම් මිලදී ගැනීම් ප්‍රාග්ධනිත කිරීම,.ප්‍රධාන ලෙජරයට ගිණුම් ගත කිරීමේ‍ද ජර්නල් සටහන් යොදා නොතිබුණි.

(ක) 2012 දෙසැම්බර් 31 දිනට විගණිත ශේෂ පත්‍රයේ සඳහන් රු.230,392 ක් වූ ගෙවිය යුතු එකතු කළ අගය මත බදු හා මුද්දර බදු ශේෂය, සමාලෝචිත වර්ෂයේ ශේෂ පත්‍රයේ ඉකුත් වර්ෂයට අදාල ශේෂ තීරුවේ රු. 62,854 ක් ලෙස දක්වා තිබූ අතර එකතුව රු.43,984,448 ක් වූ ශේෂ 5 ක් එම තීරුවේ සටහන් කර නොතිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

-------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 58,740,779 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය සමාලෝචනය

------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,786,395 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,553,232 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

-----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

-----------------------------------------------------------------

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000’ | රු.000’ | රු.000’ |
| (i.) | වරිපනම් හා බදු | 3,016 | 2,915 | 3,487 |
| (ii.) | බලපත්‍ර ගාස්තු | 2,236 | 2,259 | -- |
| (iii.) | වෙනත් ආදායම් | 162 | 72 | 137 |

2:2:2 වරිපනම් බදු

සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු බිල්කිරීම රු.2,003,652 ක් වූ අතර වර්ෂය ආරම්භයට හිඟ ශේෂය රු.3,033,989 ක් විය. සමාලෝචිත වර්ෂයේ බිල් කිරීම්වලින් රු.1,275,842 ක්ද, හිඟ ශේෂයෙන් රු.631,711 ක්ද අයවී තිබූ අතර හිඟ ආදායම් අයවීම සියයට 21 ක තරම් අඩු අගයක විය.

2:2:3 අක්කර බදු

2013 වර්ෂය ආරම්භයේ රු.34,598 ක හිඟ අක්කර බදු ශේෂයක් පැවති අතර ප්‍රවර්තන වර්ෂයේ බිල් කළ වටිනාකම රු.3,094 ක් විය. 2013 වර්ෂයේ සමස්ථ අයකිරීම රු.2,398 ක් හෙවත් 6.4% ක් වීමෙන් සභාවේ අක්කර බදු අයකරගැනීම ඉතා දුර්වල මට්ටමක පැවතුණි.

2:2:4 වෙළඳ ස්ථානීය කුලී

2013 වර්ෂයේ වෙළඳ ස්ථානීය කුලී රු.162,000 ක් බිල් කර තිබුණද ප්‍රවර්තන වර්ෂයේ අයකර ගෙන තිබුණේ රු.42,625 ක් හෙවත් සියයට 26 ක ප්‍රමාණයකි.

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 44,631,414 |
| (ii) | මුද්දර ගාස්තු | 14,333,752 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 <u>53-4618 දරන ඩබල් කැබ් රථය අනතුරට පත්වීම</u>

සභාවට අයත් 53-4618 දරන කැබ් රථය 2013 මැයි 13 වන දින අනතුරකට ලක්ව තිබුණි. ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 102, 104 විධිවිධාන අනුව අලාභ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. 2013 සැප්තැම්බර් 04 දිනැති වවුචර් අංක 13 මඟින් කැබ් රථයේ අළුත්වැඩියාව සඳහා රු.85,200 ක මුදලක් සභා අරමුදලින් ගෙවා තිබූ අතර වගකිව යුතු පාර්ශ්වයන් හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.2 කාර්යසාධනය

(අ) ප්‍රමුඛතාවය අනුව පෙළගැස්මකින් තොරව 2013 වර්ෂයේදී සභා අරමුදලින් ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපාති 53 ක් සඳහා රු.27,754,465 ක් ඇස්තමේන්තු කර තිබුණි. පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විගණිත දිනය වූ 2014 ජනවාරි 24 වන විට ඉන් ව්‍යාපෘති 33 ක් නිම කර තිබූ අතර එහි ඇස්තමේන්තුගත වටිනාකම රු.16,296,000 ක් විය. ඒ අනුව ඇස්තමේන්තුගත ව්‍යාපෘතිවලින් 41% ක ප්‍රමාණයක ව්‍යාපෘති සිදු කර නොතිබුණි.

(ii) ව්‍යාපෘති 8 ක විගණිත දිනට ඇස්තමේන්තු පමණක් පිළියෙල කර තිබූ අතර එහි ඇස්තමේන්තුගත වටිනාකම රු.4,471,000 ක් වූ අතර රු.2,757,465 ක් වූ ව්‍යාපෘති 8 ක් වෙනුවෙන් ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ ජූලි, ඔක්තෝබර් හා දෙසැම්බර් මාසවල ගිවිසුම් අත්සන් කර තිබූ ව්‍යාපෘති 4 ක් ඉටු කර නොතිබූ අතර එහි ඇස්තමේන්තුගත වටිනාකම රු.4,230,000 ක් විය.

(ආ) මග නැගුම ගාමීය සංවර්ධන වැඩසටහන යටතේ 2013 අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා ගිවිසුම් අත්සන් කර තිබූ ව්‍යාපෘති 43 ක වැඩ ආරම්භ කිරීමට විගණිත දිනය වූ 2014 ජනවාරි 24 වන විටත් කටයුතු කර නොතිබුණි.

4. පද්ධති හා පාලන
-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(i) ගිණුම්කරණය
(ii) ආදායම් පරිපාලනය
(iii) වාහන පාලනය
(iv) වත්කම් කළමණාකරණය
(v) කොන්ත්‍රාත් පරිපාලනය